" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා අප කැපවෙමු "

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**

**பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**

**OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE**

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

| | | |
|---|---|---|
| ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary | දුරකථන / தொலைபேசி / Telephone | - 011 - 2092599 |
| | ෆැක්ස් / பெக்ஸ் / Fax | - 011 - 2092601 |
| | ඊ-මේල් / மின்னஞ்சல் / E-mail | - chiefsecretary@wpc.gov.lk |
| පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone | | 011 - 2093000 |

SLSI SYSTEM CERTIFIED ISO 9001

SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/PTR/11/FI/7(A) | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2022.09.10-04 |

<u>ඉතා හදිසි</u>

ආණ්ඩුකාර ලේකම් (බ.ප),

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් (බ.ප),

සභා ලේකම් (බ.ප),

බස්නාහිර පළාතේ සියළුම අමාත්‍යාංශය ලේකම්වරුන්,

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)/ (ඉංජිනේරු) (බ.ප),

බස්නාහිර පළාතේ සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

බස්නාහිර පළාතේ සියළුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්,

බස්නාහිර පළාතේ සියළුම පළාත් පාලන ආයතන ප්‍රධානීන්,

**<u>බඳවා ගැනීමේ පරිපාටිවල සඳහන් අධ්‍යාපන සුදුසුකම්වලට වඩා අඩු සුදුසුකම් සහිතව බඳවාගෙන ඇති සේවකයින් පිළිබඳ තොරතුරු ලබා ගැනීම.</u>**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නියුතු බඳවා ගැනීමේ පරිපාටිවල සඳහන් අධ්‍යාපන සුදුසුකම්වලට වඩා අඩු සුදුසුකම් සහිතව ස්ථිර සේවයට බඳවාගෙන ඇති එහෙත් සේවය ස්ථිර කර නොමැති සියළු සේවකයින්ගේ තොරතුරු මගේ අංක: CSO/PTR/11/7 හා 2015.03.26 දිනැති ලිපිය මඟින් කැඳවූ අතර, ඒ අනුව ලද තොරතුරු අතුරින් සේවකයින් 26 දෙනෙකු දින 03 ක විශේෂ පුහුණුව සඳහා සුදුසුකම් ලද අතර, 2018.05.30 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක: VI/123/06-2018-01(i) යටතේ ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත, එම සේවකයන් වෙත 2019.05.14, 15 හා 16 යන තෙදින විශේෂ පුහුණුවක් පවත්වා එම පුහුණුවට සහභාගී වූ සේවකයන්ගේ සේවය ස්ථිර කිරීමට මීට පෙර කටයුතු කරන ලදී.

02. එහෙත්, අඩු සුදුසුකම් යටතේ ස්ථිර සේවයට බඳවා ගෙන මෙතෙක් සේවය ස්ථිර කර නොමැති යථෝක්ත තෙදින පුහුණුව සඳහා සහභාගී වීමට නොහැකි වූ හා එම අවස්ථාවේ දී තොරතුරු ඉදිරිපත් කිරීමට නොහැකි වූ සේවකයින් ඔබ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ කාර්යාලයේ තවදුරටත් සිටී නම්, මේ සමඟ අමුණා ඇති ආකෘතිය අනුව එම සේවකයින් සම්බන්ධ තොරතුරු **<u>2022.10.14 දිනට පෙර</u>** මා වෙත එවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

03. ඒ අනුව, ඇමුණුමේ ඇතුළත් ලේඛනය Iskoola Potha අක්ෂර (font) වර්ගය භාවිතා කර Microsoft Excel පැතුරුම්පතක් භාවිතයෙන් සකස් කර, එහි මෘදු පිටපත <u>achiefsecretary@gmail.com</u> විද්‍යුත් ලිපිනයට යොමු කරන ලෙස ද, එහි අත්සන හා නිල මුද්‍රාව තබන ලද දෘඩ පිටපත තැපැල් මඟින් මා වෙත යොමු කරන ලෙසත් කාරුණිකව දන්වමි.

04. මේ සම්බන්ධයෙන් ඔබගේ පෞද්ගලික අවධානය යොමු කරන ලෙසත්, එසේ අඩු සුදුසුකම් යටතේ බඳවා ගෙන මෙතෙක් සේවය ස්ථිර කර නොමැති සේවකයින් පිළිබඳ තොරතුරු එවීමට අපොහොසත් වුවහොත්, එම සේවකයන්ගේ සේවය ස්ථිර කිරිමේදී යම් ගැටළුවක් මතු වුවහොත් ආයතන ප්‍රධානියා ඒ සඳහා වගකිව යුතු බවත්, 2022.10.14 දිනට පසු ලැබෙන තොරතුරු අදාළ කර නොගන්නා බවත් කාරුණිකව දන්වන අතර, ඔබ අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවේ/ කාර්යාලයේ මෙවැනි සේවකයින් නොමැති නම් ඒ බව ද දන්වා එවීමට කටයුතු කරන ලෙසත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

05. තව ද, මෙම තොරතුරු ලේඛනය සඳහා වයස අවුරුදු 45 ඉක්මවා පත්වීම් ලද සේවකයින්ගේ හා අනියම්, ආදේශක, තාවකාලික හෝ සහන පදනම මත සේවයේ යොදවා ඇති සේවකයින්ගේ තොරතුරු ඇතුළත් **නොකරන** ලෙස ද කාරුණිකව දන්වා සිටිමි.



**අත්/කළේ-ජේ.එම්.සී.ජයන්ති විජේතුංග**
ප්‍රධාන ලේකම්
බස්නාහිර පළාත

ඩබ්.ටී.ඒ.මානෙල්
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)

ඇමුණුම -01

**<u>බඳවා ගැනීමේ පරිපාටිවල සඳහන් අධ්‍යාපන සුදුසුකම්වලට වඩා අඩු සුදුසුකම්වලට වඩා අඩු සුදුසුකම් සහිතව බඳවාගෙන ඇති සේවකයින් පිළිබඳ තොරතුරු</u>**

| අනු අංකය | නම | තනතුර | උපන් දිනය | පත්වීම් දිනය | ස්ථිර පත්වීම ලද දිනට වයස අවු.මාස. දින | අධ්‍යාපන සුදුසුකම් | බඳවා ගන්නා අවස්ථාව වන විට ක්‍රියාත්මක බඳවාගැනීමේ පරිපාටියේ සඳහන් සුදුසුකම් | අනෙකුත් සේවා කාලය (අනියම්,ආදේශක, තාවකාලික,සහන පදනම මත) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |

ඉහත සියළු තොරතුරු නිර්දේශ කර ඉදිරිපත් කරමි.

..........................................

ආයතන ප්‍රධානියා

අත්සන හා නිල මුද්‍රාව